


ශ්‍රී. බු. ව. 2559 ක්වූ දුරුතු මස කලාපය, රාජ්‍ය වර්ෂ 2016 ක් වූ ජනවාරි මස 23 වන දින

මාතර, ශ්‍රී සුදර්ශී විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# සෝවාන් පුද්ගලයා හඳුනා ගනිමු.

(සුතත නිපාතය සූත්‍රය ඇසුරිනි)

ගරු ස්වාමින් වහන්ස, පින්වත්නි.

සහාවසස දසසන සමපදය - තයසසු ධමමා ජහිතා භවනති

සකකාය දිට්ඨි විචිකිචඡි තකදච - සීලබබතංවාපි යදත්ථි කිඤචි

චතූහපායෙහිච විපපමුතෙතා - ඡචාභිඨානානි අභබෙබා කාතුං

ඉදමපි සංඝෙ රතනං පණීතං - එතෙන සවෙචන සුවත්ථි හොතු

(සුතතනිපාතය - රතන සූත්‍රය)

'' ඔහුට සෝවාන් ඵලය ලැබීමත් සමගම කරුණු තුනක් ප්‍රහීණ කළා වන්නේය. සකකාය දිටඨිය, විචිකිචඡාව, සීලවෘත ආදී යමක් ඇත්නම් ඒවාය. ඔහු සතර අපායෙන්ද මිදුනේය.හය වැදෑරුම් දරුණු පාපයන් කිරීමට නුසුදුසු වන්නේය. මෙයද සංඝයා කෙරෙහි පවත්නා වූ රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සියලු සත්නට සෙතක්ම වේවා''

අද දුරුතු පුර පසළොස්වක පොහොය දිනයයි. 2016 නව වසරට උදා වූ මුල්ම පොහොය දිනයයි. අපේ බුදුපියාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් වූ මිගදායේදී පළමු ධර්ම දේශනාව පවත්වා රජගහනුවර බලා වැඩම කළහ. අතර මග පිහිටි උරුවෙල් දනව්වෙහි ජීවත් වූ උරුවෙල් කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යන ජටිලයින් තුන්දෙනා ඇතුළු දහසක් පිරිසට දහම් දෙසා රහත් ඵලයෙහි පිහිටුවා ඊළඟට වැඩම කළේ ලක්දිව මහවැලි ගඟ අසබඩ මහියංගනයේ මහා නාගවන නම්

වූ රමණීය උයන වෙතය. ඒ නිසා බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමන සිදු වූයේ අද වැනි දුරුතු පුර පසළොස්වක පොහොය දිනයකය.

එදා එම ප්‍රදේශයේ ජීවත් වූයේ හැඩි දැඩි ගති වලින් යුක්ත යක්‍ෂ ගෝත්‍රිකයෝය.ඔවුන්ට දහම් දේශනා කොට පහදවා ගත් සේක. එදින එතනට පැමිණි සුමන සමන් ගිරට අධිපති සුමන සමන් දෙවියන්ද බණ අසා සෝවාන් විය. වැඳුම් පිදුම් කිරීමට යමක් ඉල්ලූ විට සිරස පිරිමැද කේෂ ධාතූන් වහන්සේලා සමන් දෙවියන්ට දුන් බවත් සමන් දෙවිඳු එම කේෂ ධාතූන් වහන්සේලා තැන්පත් කොට බුදුන් වහන්සේ වැඩ සිටි තැන රියන් 7 ක් උස ඇති දගැබක් කළ බවද සඳහන් වේ. ඒ අනුව ලංකාවේ පිහිටි මුල්ම චෛත්‍යය මහියංගන චෛත්‍යයයි. පසු කලෙක බුදුන් වහන්සේගේ ග්‍රීවා ධාතුව ගෙනවුත් සැරියුත් හිමියන්ගේ ශිෂ්‍ය සරභූ නම් රහතන් වහන්සේ එම චෛත්‍යයෙහි තැන්පත් කොට දොලොස් රියන් උසට බැන්ද වූ බවත්, පසුව දෙවන පෑතිස් රජුගේ සොහොයුරු උද්දචූලාභය රජතුමා රියන් 30 ක් උසට චෛත්‍ය සකස් කළ බවත්, ඉන් පසුව දුටු ගැමුණු මහ රජතුමා විසින් අසූරියන් කොට චෛත්‍ය නිර්මාණය කොට පුදසත්කාර කළ බවත් සඳහන්වේ. සාසන ඉතිහාසයෙහි සඳහන් මේ කරුණු නිසා මෙම පොහොය දිනය ලක්වැසි හැම දෙනාටම වැදගත් දිනයකි.

මෙම වැදගත් දිනයේදී මේ සදහම් පණිවිඩයෙන් අපේ බලාපොරොත්තුව වන්නේ සෝවාන් පුද්ගලයා හඳුනා ගැනීමටයි. ඉහත දැක්වූ ගාථාව අඩංගු රතන සූත්‍රයේ සඳහන් වන්නේ තුණුරුවන්ගේ ගුණ පිළිබඳව විස්තරයකි. විශාලා මහනුවර වාසීන්ට තුන් බියකට මුහුණ දීමට සිදු වූ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ එහි වැඩම කරවා තුණුරුවන්ගේ ගුණ මෙනෙහි කරමින් සත්‍ය ක්‍රියා කළ බවත්, ඒ නිසා විසාලා මහනුවර ජීවත් වූ අයට සෙත් ශාන්තිය උදා වූ බවත්, සඳහන් කරයි. නූතනයේ දී අපට කරදරයක් සිදුවූ විට අප කරන්නේ විවිධ දෙවිවරුන්ගේ හැකියාවන් දක්වා සෙත් කවි කියවා ගැනීමෙන් අපල දුරු කර ගැනීමට උත්සහ දැරීමයි. නමුත් බුද්ධිමත්ව සලකා බැලුවොත් රතන සූත්‍රයේ සඳහන් ගාථා සමූහය තරම් ප්‍රබල සෙත් කවි මාලාවක් තවත් කොතනකවත් නැත. ඒ ගාථාවල සඳහන් වන්නේ තුණුරුවන්ගේ සත්‍යවාදී ගුණයෝයි. ඒ ගුණ පිළිබඳව විශ්වාසයෙන් යුතුව ශ්‍රවණය කිරීමෙන් යහපත් ප්‍රතිඵල උදා කර ගත හැකිය. එම ගාථා හොඳින් තේරුම් ගෙන එම ගුණ අපේ ජීවිතවලට ඇතුළත් කර ගත හැකි නම් ඊට වඩා හොඳ ප්‍රතිඵල උද කර ගත හැකිය. නමුත් අද බොහෝ දෙනා හුරු වී ඇත්තේ මෙම උතුම් සූත්‍ර දේශනා සජ්ඣායනා කිරීමෙන් ඵල ලැබිය හැකිය යන අදහසටයි. එම ගුණ අපේ ජීවිත වලට තම ශක්ති පමණින් ඇතුලත් කර ගනිමින් සජ්ඣායනය කිරීමට මේ නව වසරේ උත්සහවත් වෙමු .

එලෙසින් නව වසරේ මුල්ම පොහෝ දිනයේ දී සෝවාන් වූ පුද්ගලයා හඳුනා ගෙන අපේ ජීවිතත් ඒ තත්වයට පත් කර ගැනීමට උත්සහ කරමු. අප සියළු දෙනා මේ දිගු සසරට බැඳ තබන සංයෝජන ධර්ම දහයකි. ඉන් මුල් සංයොජන ධර්ම තුන නැති වන්නේ සෝවාන් වීමෙනි. සක්කාය දිට්ඨිය, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යනු එම කරුණු තුනයි.

සක්කාය දිට්ඨිය යනු සවකීය කය තුළ ස්ථිරවූ යමක් ඇතැයි පිළිගැනීමයි. එදා ආත්මවාදීන් කියා සිටියේ අපේ වෙනස්වන ශරීරය තුළ ආත්මය නම් වූ වෙනස් නොවන ස්ථිර දෙයක් ඇති බවයි. එහෙම ස්ථිර කිසිවක් බුදුදහම නොපිළිගනී. බුදුදහම කියන පරිදි අපේ ශරීරය සකස්ව තිබෙන්නේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, යන ශක්ති පහේ එකතුවෙනි. මේ ශක්ති පහ තුළම නිත්‍යවූ ආත්මීය කිසිවක් නැත. පුද්ගලයා නාම රූප වශයෙන් දෙකකටත්, උපාදානස්ඛන්ධ වශයෙන් පහකටත් ආයතන වශයෙන් දොළහකටත්. ධාතු වශයෙන් දහ අටකටත් බෙදා දක්වා ඇත්තේ මේ සක්කාය දිට්ඨිය ප්‍රහාණය කිරීම සඳහායි. අභිධර්මය තුළ ද චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යන මේවා බෙදා දැක්වීමෙන් සිදුකර ඇත්තේ සක්කාය දිට්ඨිය. ප්‍රහාණය කිරීමේ වැඩපිළිවෙලකි. බුදුදහම හැඳින්වීම සඳහා විවිධ නම් යොදා ගෙන ඇත. ඒ නම් අතර ඉතාමත් ගැලපෙන නම විභජ්ජවාදය යන්නයි. එහි

තේරුම බෙදා දැක්වීමයි. බෙදන්නේ කුමටද? සක්කාය දෘෂ්ඨිය ප්‍රහාණය කිරීමටයි. තම ගෙදරින් පටන් ගෙන ගම,රට, ලෝකය යන හැම තැනකම ගැටලු නිර්මාණය වී තිබෙන්නේ මෙම සක්කාය දිට්ඨිය නම් වූ මමත්වය තුළිනි. අප ජීවත් වන ලෝකය චංචලය. එම චංචල ලෝකය තුළ නිශ්චල කිසිවක් නැත. යමෙක් එසේ ස්ථිර කිසිවක් ඇතැයි අපේක්ෂාවෙන් ක්‍රියා කරන විට ඒවා වෙනස් වුවහොත් සමහරුන්ට එම ආවේගය දරාගන්ට බැරිව ජීවිතයෙන් පවා සමුගන්නා සැටි අප දැක ඇත. එසේ නම් සෝවාන් වන පුද්ගලයා එම ගැටලු සියල්ල නිරාකරණය කර ගනී. අප සසරට බැඳ තබන සක්කාය දිට්ඨිය කොතරම් බරපතල සංයොජයයක්ද යන්න සංයුත්ත නිකායේ දෙවතා සංයුත්තයෙහි සතති සූත්‍රය පැහැදිලි කරයි. එහි එක්තරා දේවතාවෙක් බුදුන් වහන්සේට මෙවැනි අදහසක් පළ කරයි.

''ආයුධයකින් පහර ලද්දෙකු මෙන්ද, හිස ගිනිගෙන දැවෙන්නෙකු මෙන්ද,භික්ෂුව කාමරාගය ප්‍රහාණය පිණිස සිහි ඇතිව වාසය කරන්ණේය.''

සතතියා විය ඔමටෙඨා - ඩයහමානොව මත්ථකෙ

කාමරාගපපහාණාය - සතො භිකබු පරිබබජෙති (සතති සූත්‍රය )

මෙහිදී බුදුන් වහන්සේ එම දේවතාවාගේ අදහස සුළු වෙනසක් කොට අලුත් අදහසක් ඉදිරිපත් කරයි.

''ආයුධයකින් පහර ලද්දෙකු මෙන්ද, හිස ගිනි ගෙන දැවෙන්නෙකු මෙන්ද, භික්ෂුව සකකා දිට්ඨිය ප්‍රහාණය කිරීම සඳහා සිහි ඇතිව වාසය කරන්නේය''

සතතියා විය ඔමටෙඨා - ඩයහමානොව මත්ථකෙ

සකකාය දිට්ඨි පහාණාය - සතො භිකබූ පරිබබජෙති''(සතති සූත්‍රය)

එම අදහසින් පැහැදිලි වන්නේ කාමරාගය ප්‍රහීණ කිරීමට වඩා සකකාය දිට්ඨිය ප්‍රහාණය කිරීම උතුම් බවයි. එයින් පැහැදිලි විය යුත්තේ කාමරාගයටත් හේතුවසකකාය දිට්ඨිය බවයි. රූප වේදනා ආදී ස්කන්ධයන් පිළිබඳව මමය මාගේය යන හැඟුම ඇතිවන විට කාම රාගය පහළ වෙයි. එම ස්බන්ධයන් පිළිබඳව මම යන හැඟුම නැති කර ගැනීම යනු සකකාය දිට්ඨිය ප්‍රහීණ වීමකි. සෝවාන් වීම තුළ දැකිය හැකි ප්‍රධානම දේ සකකාය දිට්ඨිය ප්‍රහාණයයි. ඒ තුළින් බොහෝ ගැටලු නිරාකරණය කර ගත හැක.

සෝවාන් වූ පුද්ගලයා දෙවනුවට නැති කරන සංයෝජන ධර්මය විචිකිච්ඡා නම් වූ සැකයයි. තුණුරුවන් පිළිබඳවත්, ධර්මය පිළිබඳවත්, විශ්වාසයක් නැති වීම විචිකිච්ඡා නම් වේ. බුදුන් වහන්සේ, ධර්මය, සංඝයා, පෙර ආත්ම භාවය, පසු ආත්මභාවය, පෙර පසු ආත්ම භාවය, ශික්ෂා පිළිබඳව, පටිච්ච සමුත්පාදය යන කරුණු අට පිළිබඳව විශ්වාස නොකිරීම මේ අට වැදැරුම් සැකයයි. තුණුරුවන් පිළිබඳව සැකය ඇති වූ විට තුණුරුවන් වෙත නොඑළඹෙයි. එවිට තෙරුවන් ඇසුරු කිරීමට නොහැකිවෙයි. තෙරුවන් වෙත කන් යොමු නොවන නිසා ධර්මය නොඇසේ. එවිට විමුක්තිය උදා කර ගත නොහැක. පෙර අපර භවයන් ගැන සැක ඇත්තා හොඳ ආචාර ධර්ම වලින් ඈත් වෙයි. ශික්ෂා පද ගැන සැක ඇති අය එම ශික්ෂාවන්ට අවනත නොවී ක්‍රියා කොට තම ජීවිතය අසාර්ථක කර ගනී. පටිච්ච සමුපපාදය යනු බුදුදහම උගන්වන ආර්ය මාර්ගයේ න්‍යායයි. එම න්‍යාය ගැන යමෙකුට සැක පහළ වනවාය. කියන්නේ ඔහු වැරදි මගට පිළිපන් බවයි. මෙම බුදධාදී අට තැන පිළිබඳ සැකය නම් වූ විචිකිච්ඡාව නැති වන්නේ සෝවාන් වීම තුළිනි.

සෝවාන් ඵලයට පත් වීමෙන් නැතිවන ඊළඟ සංයෝජන ධර්මය සීලබබත පරමාසයයි. බුදුදහමේ ඉගැන්වෙන චූලසීල මජ්ඣිමසීල, මහා සීල, ගැන සෑහීමකට පත් නොවී ක්‍රියා කරන සමහරු වෙනත් ව්‍රත සමාදන වල යෙදී ක්‍රියා කරති. අජව්‍රත, ගෝ ව්‍රත, සුනඛ ව්‍රත වැනි ව්‍රත සමාදනවල යෙදී

ක්‍රියා කිරීමෙන්ද එම පුද්ගලයා සසර දිගු කර ගනී. ඒ හැම ව්‍රත සමාදානයක්ම නියෝජනය කරන්නේ අතතකිලමථානු යෝගයයි. බුදුදහම අතතකිලමථානු යෝගය වචන තුනකින් ප්‍රතික්ෂේප කරයි. එම මාර්ගය දුක් සහගතය, උතුම් නොවේ අනර්ථය පිණිසම පවතී යනුවෙනි. එම සීලබබත පරාමාසයද නැති වන්නේ සෝවාන් ඵලයට පත් වීමෙනි.

මිනිසත් ආත්ම භාවයක් ලබා ගැනීම දුර්ලභ කාර්යකි. එම පුද්ගලයා සතර අපායෙන් මුදවා ගන්නේ සෝවාන් ඵලයට පත් වීමෙනි. නරක,තිරිසන්,ප්‍රේත,අසුර යන සතර අපායට වැටුනොත් එයින් මිදීමට එතරම් පහසු නොවේ. මෙම සතර අපාය වලින් නරක,ප්‍රේත,අසුර යන මේවා අපේ ඉඳුරන්ට ගොදුරු නොවුනත් ඉඳුරන් දියුණු කළ උතුමන්ගේ ප්‍රකාශ වලින් ඒවායේ  තත්වය සිතාගත හැකිය. තිරිසන් ලෝකය ගැන අපේ ඉඳුරන්ට ප්‍රත්‍යක්ෂ බැවින් එහි පවත්නා දුක පිළිබඳව තත්වය සිතා ගත හැක. මිනිස් ආත්මයක් ලැබූ කෙනෙකු  එසේ සතර අපායට වැටීම මහත් අභාග්‍යයකි. සෝවාන් වූ පුද්ගලයා සතර අපායට නොයන බව සඳහන් කරයි. (චතූහපායෙහිච විපපමුතෙතා)

සෝවාන් වූ පුද්ගලයාගෙන් වැරදි හයක් සිදු නොවන බව කියයි. මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුදු සිරුරෙන් ලේ සෙලවීම, සංඝ භේදය, නියත මිත්‍යා දෘෂටිය නම් වූ වෙනත් ශාස්තෘවරයෙකු විශ්වාස කිරීම. එම වැරදි හයයි. සෝවාන් වූ පුද්ගලයා එම වැරදි හයෙන් මිදී ඇති බව කියයි.(ඡචාභිඨානාභි අභබෙබා කාතුං) සමාජයේ ජීවත් වන පුද්ගලයෙකුට මේ වැරදි  වලට පත් වීමට සිදු වුවහොත් ඔහුට මානසික අසහනයක් ඇතිවේ. එම  මානසික අසහනය ඇති උනොත් විමුක්තිය උදාකර ගත නොහැකිය. ඒ නිසා එම වැදි හයෙන් නිදහසක් ලැබෙන්නේ සෝවාන් වීමෙනි. මෙම සෝවාන් පුද්ගලයාගේ ගුණ පවසා විසාලා මහනුවර මිනිසුන්ට කළ සත්‍ය ක්‍රියාව ඉහළම ගණයේ සෙත් කවියකි.

නූතනයේ බෝහෝ දෙනා සෝවාන් වී ඇතැයි විවිධ ආරංචි පැතිරී තිබේ.ඒවා බොරුයයි කීමට අපට අවශ්‍යතාවයක් නැත. සමහරු සෝවාන් වූ අයට සහතික පිරිනමනවාය කියාද ආරංචි ඇත. ඒ කිසිවක් පිළිබඳව උරණවීමට අවශ්‍ය නැත. ඉහත කී සුදුසුකම් යම් කෙනෙකුට ඇති කර ගත හැකි නම් ඔහු සෝවාන් ඵලයට පත් වී ඇතැයි පිළිගත හැක. අද වැනි දුරුතු පුර පසළොස්වක පොහොය දිනයක බුදුන් වහන්සේ හමු වීමට පැමිණි සුමන සමන් දෙවියන්ද සෝවාන් වුණ බව කියයි. එසේ නම් බොරු ප්‍රදර්ශණ වලින් තොරව මෙම ගාථාවේ සඳහන් කරුණු වලට අනුව ක්‍රියා කළ හොත් අප කාටත් සෝවාන් වීමේ භාග්‍ය උදකරගත හැක. බුදධ භාසිත ශ්‍රී සද්ධර්මයේ සඳහන් මෙම සෝවාන් ඵලය ගැන දන්නා ගිහි පැවිදි බොහෝ අය වෙති. ඔවුන්ගෙන් ප්‍රශ්න කළහොත් පෙළ දහමේ සූත්‍ර අනුසාරයෙන් ඒවාට අදළ අටුවා ආදියට අනුව සෝවාන් වීම ගැන තොරතුරු දැන ගත හැක.මේ වන විට සෝවාන් වීම ගැන කොතරම් පොත් මුද්‍රණය කර ඇත්ද? ඒවාට දොස් කීම හොඳ  නැත. ඒ පොත් පත් පරිශිලනය කොට සෝවාන් වීම ගැන තවතවත් කරුණු එකතු කර ගත යුතුය. නමුත් ඒ සියළු දැනීම් බාහිර දැනීම් මාත්‍රයෝය. එබැවින් අප කළ යුත්තේ සෝවාන් විම තම ඉන්ද්‍රියානුභූතියක් බවට පත් කර ගැනීමයි. එසේ සෝවාන් වූ අය විවිධ තැන් වල තම සිතේ ඇති වූ සතුට පල කර තිබේ. අපටත් එවැනි සතුටක් ඇති කර ගැනීමට නම් අපිත් සෝවාන් ඵලයට පත් විය යුතුය.

වත්මන් ගිහි පැවිදි සමාජ දෙස බලන විට පෙනී යන්නේ බෝහෝ දෙනෙක් කායික හා මානසික අසහනයෙන් ජීවත් වන බවයි. අඩුපාඩුකම් සොයමින් ලද දෙයින් සතුටු නොවෙමින් අසහනයෙන් ඔවුන් ජීවත් වන්නේ ඉහත සඳහන් කළ සකකාය දිටඨිය නම් වූ ප්‍රබල සංයෝජන ධර්මය නිසායි. ඒ නිසා මෙහිදි උපාදානයෙන් අල්ලා ගැනීම වෙනුවට අනුපාදීව අත් හැරීමට පුරුදු විය යුතුය. අප ජීවත් වන ලෝකය චංචල  බවත් ඒ තුළ නිශ්චල කිසිවක් නැති බවත් සිතමින් හිස ගිනි ගත් පුද්ගලයෙකු ඒ ගින්න නිවා ගැනිමට උත්සහ දරන්නා සේ සකකාය දිටඨිය ඇතුළු සංයෝජන නිවා දමා සෝවාන් පුද්ගලයෙකු බවට පත්වී ජීවන ගැටලු නිරාකරණය කර ගැනීමට උත්සහවත් වෙමු.


ඔබටත් අමා ගඟුල සදහම්
පත්‍ර ලබා ගැනිම සදහා
lakruhunu@gmail.com
LakRUHUNU
Monthly BUDDHIST magazine